# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2086/9 – 2018 අගෝස්තු මස 27 වැනි සඳුදා – 2018.08.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 551 රත්විට, සහ 552 ගොපල්ලව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වැදිපොල, පෙතන්ගල්ල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කේයු/ආර්ඩීජී/2016/703 හා 2016.10.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

1. කැබලි අංක 133 – කහටගහ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0145 උතුරට: කේ. එම්. සුනිල් බන්නැක හිමිකම් කියන කහටගහකුඹුර සහ එච්. එම්. පී. එස් බණ්ඩාර හිමිකම් කියන මයිලගහකුඹුර; නැගෙනහිරට: කැබලි අංක 132 සහ 129; දකුණට: කැබලි අංක 129 සහ වැදිපොල ඇළ; බටහිරට: කේ. එම්. එස්. බන්නැක හිමිකම් කියන කහටගහකුඹුර සහ කේ. එම්. සුනිල් බන්නැක හිමිකම් කියන කහටගහකුඹුර.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

යොමු අංකය: 4-3/7/2016/එච්ඩබ්ලිව්/307.
2018 ජූලි මස 12 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

09 - 239


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*